# මිළඟ පාර්ලිමේන්තුව කුමක් සඳහා විය යුතු ද - IV

මිළඟ පාර්ලිමේන්තුවේ සන්ධානයට තුනෙන් දෙකේ බලයක් ලැබීමට විශාල ඉඩක් ඇති බව අපි කීවෙමු. එවැනි බලයක් ලැබුණහොත් කළ හැකි හා කළ යුතු කාර්යයන් රාශියක් වෙයි. හැම කාර්යයක් ම වැදගත් වේ යැයි කිව හැකි නමුදු විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් වෙයි. ඒ අතර රටේ ඒකීයභාවය රැකගැනීම, ව්‍යවස්ථා සංශෝධනය, සංවර්ධනය, සංස්කෘතිය අපට අවශ්‍ය අයුරින් වෙනස්කිරීම හා රැකගැනීම, අධ්‍යාපනය, සුභ සාධනය, කෘෂිකර්මය හා කර්මාන්ත, සෞඛ්‍යය, දූෂණය හා නාස්තිය නැතිකිරීම, මෙරට නැවත ධර්මද්වීපයක් බවට පත්කිරීම ආදිය ප්‍රධාන වේ යැයි සිතමි. මේ සියල්ල ලිපි දෙකකින් විස්තර කිරීමට නොහැකි බව අමුතුවෙන් කිවයුතු නො වේ. එහෙත් අප මනාප දීමේ දී අපේ නියෝජිතයන් ලෙස පත්වන අය අපට අවශ්‍ය අයුරින් කටයුතු කරන අය බවට වග බලාගත යුතු වෙයි. ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය යැයි අද නොකියන්නකු නැත. ජේ ආර් ජයවර්ධන ජීවත් ව සිටියේ නම් ඔහු ද ව්‍යවස්ථාව සංශෝධනය කොරන්නට ඉදිරිපත්වනු නො අනුමානය. මනාප ක්‍රමයට තවත් ඉඩදිය නො හැකි ය. අද ජ වි පෙ ද මනාප පොරයට එක් වී සිටියි. ජෙනරාල්ට මනාප දීමට ඉදිරිපත්වන ජ වි පෙරමුණු පාක්ෂිකයෝ වෙත් ද? ව්‍යවස්ථා සංශෝධනයක් නොව අලුත් ම ව්‍යවස්ථාවක් අපට අවශ්‍ය වෙයි. එසේ නැතිව අප ව්‍යවස්ථා සංශෝධනය යන්නෙන් වගන්ති කිහිපයක් සංශෝධනය කිරීමක් පමණක් අදහස් කෙරෙන්නේ නම් එයින් ජනතාවට අත්වන සුගතියක් නැත. පසුගිය අවුරුදු හැටදෙකක ඉතිහාසයෙන් වැඩි කාලයක්, එනම් අවුරුදු තිස්දෙකක් අපි විධායක ජනාධිපති ක්‍රමයක ජීවත්වීමු. විධායක ජනාධිපති ක්‍රමයෙහි නරක පැත්ත මෙන් ම හොඳ පැත්ත ද අපි දනිමු. විධායක ජනාධිපති ක්‍රමය නොවන්නට කිසි දිනෙක ප්‍රභාකරන් හා දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමට නොහැකිවීමට තිබිණි.

මෙයින් කියැවෙන්නේ ඕනෑම විධායක ජනාධිපතිවරයකුට හෝ ජනාධිපතිනියකට හෝ දෙමළ ත්‍රස්තවාදය පරාජය කළ හැකිව තිබුණු බව නො වේ. අපි ඒ බව අත්දැකීමෙන් ම දනිමු. බටහිර හා ඉන්දීය බලපෑම් ඉදිරියේ දණින් නොවැටෙන ජනාධිපතිවරයකු යටතේ පමණක් ඒ කළ හැකිව තිබුණි. විධායක ජනාධිපති ධුරය යම් ආකාරයකින් සංශෝධනය කිරීමත් ඇතැම් කරුණුවලින් පාර්ලිමේන්තුවට (රාජ්‍ය සභාවට) බලතල වැඩියෙන් දිය යුතුව ඇත. ව්‍යවස්ථාදායකය හා විධායකය යනුවෙන් බටහිර උගතුන් විසින් හැඳින්වෙන සංකල්ප ලංකාව වැනි රටවල් සම්බන්ධයෙන් වලංගු නොවන බව අපි දැන්වත් අවබෝධ කරගත යුතු වෙමු. බලතල වෙන්කිරීම යන්න බටහිර ද ව්‍යාජයක් පමණකි. ජනාධිපති (රාජ්‍ය නායක) හා රාජ්‍ය සභාව වෙන වෙන ම හා එකට ක්‍රියාකරන්නේ කෙසේ ද යන්න අමුතුවෙන් සිතා බැලිය යුතු ය. ඒ සමග රාජ්‍ය සේවය කිනම් කරුණු සම්බන්ධයෙන් ස්වාධීන විය යුතු ද යන්නත් අධිකරණය (රාජ්‍ය යුක්තිය) ක්‍රියාකරණ ආකාරයත් අපට සුදුසු ආකාරයකින් සූත්‍රගත කළ යුතු ය. මේ සියල්ලෙහි දී ම එය හෝ මෙය හෝ යන ද්විකෝටික ඇරිස්ටෝටලීය න්‍යාය මත පදනම් නොවී එය හෝ මෙය හෝ මෙන් ම එය හා මෙය ද යන අපට හුරු පුරුදු චතුස්කෝටික න්‍යායේ එක් කෙළවරක් මත ද පදනම් විය යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී චතුස්කෝටිකයට අනුව එයත් නො වේ ය මෙයත් නො වේය යන්න ද සැලකිල්ලට ගත යුතු ය.

බටහිරයන්ගේ ව්‍යාජ බලතල වෙන්කිරීම අපට අදාළ නො වේ. අපි වෙන්කරන්නෝ නො වෙමු. බටහිරයෝ ද එසේ නොකරති. එහෙත් ඔවුන් එසේ කරන බව පෙන්වීම සඳහා න්‍යායාත්මක තලයෙහි අවශ්‍ය ව්‍යුහ තනාගෙන ඇත. අප මේ ව්‍යාජයට හසු නොවිය යුතු ය. අද මෙරට ප්‍රජාතන්ත්‍රවාදය නිසි ලෙස ක්‍රියාත්මක නොවන්නේ යැයි ඊනියා උගතුන් නගන හඬ මායිම් කළ යුතු නො වේ. බටහිරයන්ගේ ව්‍යාජ ව්‍යුහ ලංකාව වැනි රටවල ක්‍රියාත්මක කළ හැකි නො වේ. බටහිර ප්‍රජාතන්ත්‍රවාදය පොතට පමණක් සීමා වූ ව්‍යාජ සංකල්පයකි. ඊනියා මානව අයිතිවාසිකම්, භාෂණයේ නිදහස පොතේ ඇති ආකාරයෙන් බටහිර රටවල ක්‍රියාත්මක නො වේ. මෙරට මාධ්‍ය නිදහස නැතැයි කියමින් බටහිර රටවලට ගොස් සිටින සිංහල ලේඛකයන්ට (තමන් සිංහල නොව ලාංකිකයන් යැයි මේ පඬියන් කියනු ඇත) ඒ රටවල පළවන තුන්වැනි පංතියේ සඟරාවකවත් ලිපියක් පළකර ගත හැකි ද? ඔවුන්ට අවසානයේ දී ලිපියක් පළ කරවා ගත හැක්කේ ද මාධ්‍ය නිදහස නැතැයි ඔවුන් ලෝකයට හඬ ගා කියන ලංකාවේ පමණ ය. බීබීසිය තම දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය පැරණි යටත්විජිතවල පවත්වාගෙන යෑමේ අරමුණින් නඩත්තු කරන ඒ ඒ භාෂාවලින් ප්‍රචාරය කරන සංදේශය වැනි අගුපිල් වැඩසටහන්වල අඳබාලයන් කිහිප දෙනකු සේවය කරන බව අපි දනිමු. එහෙත් මේ එක වැඩසටහනක්වත් ඉංගිරිසින් සඳහා නිපදවන්නේ නො වේ. මොවුහු එංගලන්තයේ ජනමාධ්‍යවල සේවය කරන, එංගලන්තයට (බීබීසියට) අවශ්‍ය දේ අපට කියන ජඩමාධ්‍යවේදියෝ වෙති. ඔවුන්ගේ වැඩසටහන්වලට සවන් දෙන ඉංගිරිසි ජාතිකයකු තබා එරට බල්ලකුවත් (ඩොගියකුවත්) නැත. ඔවුහු නමට බිරිතානි ජනමාධ්‍යවේදියෝ වෙති.

© Prof. Nalin De Silva

මෙරට දෙමළ ජාතිවාදය අද ක්‍රියාත්මකවන්නේ බටහිර රටවල විසිරුණු දෙමළ ජනයා මාර්ගයෙනි. දහනවවැනි සියවසේ මුල්භාගයේදී දෙමළ ජාතිවාදය ක්‍රියාත්මක වූයේ මෙරට හදවතින් හා බුද්ධියෙන් ඉංගිරිසින් වූ දෙමළ නායකයන් මගිනි. අද විසිරුණු දෙමළ ජනයා ඒ සඳහා යොදාගැනෙති. ඊනියා දෙමළ ප්‍රශ්නය විසඳීමට බලය විමධ්‍යගතකිරීමක් අවශ්‍ය නොවන්නේ එවැනි ප්‍රශ්නයක් නොමැති බැවිනි. ජනතාවට පොදු වූ ප්‍රශ්න විසඳීමට කළ යුත්තේ මෙරට සියලුම ජනයාට තම දෛනික කටයුතු තම ප්‍රදේශවලදීම කරගැනීමටත් අදාළ තීරණ තමන්ට ම ගතහැකි ආකාරයටත් නීති රීති සම්පාදනය කිරීම ය. එක්සේසත් රාජ්‍යයක් පිහිටුවීමෙන් මේ කරුණු ඉටුකර ගත හැකි ය. එක්සේසත් යනු එක්සත් හෝ සන්ධීය හෝ නොවන රාජ්‍යයකි. අවශ්‍ය නම් එය පරිපාලනය හැකිතාක් ජනතාවට ලබාදෙන ඒකීය රාජ්‍යයක් ලෙස හැඳින්විය හැකි ය. ඒ කළ හැක්කේ ගම් සභා ජන සභා ආදියෙන් මිස ඊනියා බලය බෙදීම්වලින් හා පළාත්සභා වැනි ආයතන ඇති කිරීමෙන් නො වේ.

දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයට එරෙහි ව ගෙනෙන ප්‍රබල තර්කයක් ගැන අපි ගිය සතියේ සඳහන් කෙළෙමු. ඒ නීතිමය වූවකි. එහෙත් තුනෙන් දෙකක ඡන්දයක් ඇත්නම් ඒ දේශපාලනිකව ම අහෝසි කළ හැකි ය. දහතුන්වැනි සංශෝධනය පමණක් නොව කඩිමුඩියේ පුහු බටහිර උගතුන් සැනසීමට සම්මත කෙරුණු දහහත්වැනි සංශෝධනය ද අහෝසි කළ යුතු ය. එසේ කී පමණින් ප්‍රජාතන්ත්‍රවාදය වළපල්ලට යවන්න සූදානම් වන්නේ දැයි මේ පුස්සන් ප්‍රශ්න කරනු ඇත. දහහතේ අවශ්‍යතාව විධායක ජනාධිපතිගේ බලතල කප්පාදු කිරීම ය. අලුත් ව්‍යවස්ථාවක් සම්පාදනය කරන විට බටහිර ක්‍රමයට බලතල වෙන්කිරීමක් ගැන නොසිතා රාජ්‍ය නායක, රාජ්‍ය සභාව, රාජ්‍ය සේවය, රාජ්‍ය යුක්තිය ආදිය අතර බලය බෙදාහදා ගැනීමක් ගැන සිතීමෙන් මේ ප්‍රශ්න විසඳා ගත හැකි ය. අප සිතන්නේ ඇරිස්ටෝටල්ට අනුව නොව නාගර්ජුන හාමුදුරුවන්ට හා මහාවිහාරයට අනුව බව උගතුන් ඉගෙන ගත යුතු ය.

මහාවිහාරය අනුදැන වදාළ සංස්කෘතික ප්‍රතිපත්තියක් ද මෙරට විය. එහෙත් අද ක්‍රියාත්මක වන්නේ බටහිර සංස්කෘතික ආධිපත්‍යයට යටවන ප්‍රතිපත්තියකි. එහි මෙරට නියෝජිතයෝ මහාරාජලා හා පොඩිරාජලා වෙති. පෞද්ගලික ගුවන් විදුලියක් මුලින් ම ආරම්භ කළ කාලයේ දී ම එහි භයානක විපාක අපි දුටුවෙමු. අවුරුදු එකසිය පනහකට අධික කාලයක් තිස්සේ පාසලින් කරගැනීමට නොහැකි වූ බටහිර සංස්කෘතික ආධිපත්‍යය මෙරට තහවුරු කිරීම පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය ඔස්සේ පසුගිය අවුරුදු විස්සක් පමණ කාලයක තීව්‍ර ව කෙරීගෙන යයි. නව පාර්ලිමේන්තුවෙන් ජාතික සංස්කෘතික ප්‍රතිපත්තියක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු ය. හෝටලයක බුදුන්වහන්සේගේ පිළිම වහන්සේ නමක් (හෝටලයේ පිළිම වහන්සේ නමක් නිර්මාණය කෙළේ අභවල් දෙයකට දැයි අපි නො දනිමු.) ඉදිරියේ උන්වහන්සේ දෙසට තම නිතඹ උස්සමින් රඟන තන්හා රතී කාමුක සුනඛ පුත්‍රීන් (අකෝන්ගේ සෙක්සි බිච් යන අන්වර්ථ නාමයෙන්) දෙදෙනකුගේ ගායකයා වූ සෙනෙගල් ඇමරිකන් ජාතිකයකු වූ අකෝන් ලංකාවට ගෙන්වා ගැනීමට අවශ්‍ය වූයේ මෙරට ඊනියා සංචාරක කර්මාන්තය නැංවීමටලු. (පිළිම වහන්සේට මේ රැඟුම්වලින් කිසිවක් සිදු නො වේ. ඒ වෙන ම කරුණකි.) මෙවැනි සුනඛ සංස්කෘතික සන්දර්ශන නැවැත්වීමට අපට පණ ඇති පණතක් අවශ්‍ය වෙයි. මෙහි දී සංස්කෘතික පොලීසියක් අපට අවශ්‍ය නැතැයි පුහු උගතුන් බෙරිහන් දෙනු ඇත. අපට සංස්කෘතික පොලීසියක් නොව සංස්කෘතික හමුදාවක් අවශ්‍ය ය. ඒ අන් කිසිවකට නොව බටහිර සංස්කෘතික පෙන්ටගනය පසු බැස්සවීමට ය. පුස්සෝ සංස්කෘතික පෙන්ටගනය නො දකිති. පුස්සන් අපට කියන්නේ බටහිර සංස්කෘතික ආධිපත්‍යයට යටවීමට ය. ඔවුන් එයට කලාකරුවාගේ නිදහස වැනි අනන් මනන් වචන යොදාගනු ඇත. කලාකරුවන්ට පමණක් නොව මෙරට ඊනියා විද්‍යාඥයන්ට ද අද ඇත්තේ බටහිර සංස්කෘතික පෙන්ටගනයට යට වී ඔවුන්ගේ මතිමතාන්තර අපට පැටවීමේ කාර්යභාරය ය. ඔවුහු එයට අර නිදහස මේ නිදහස යැයි කියති. ඉතා පැහැදිලිව ම ඔවුන්ට ඇති මේ නිවට පෞද්ගලික නිදහස නැති කළ යුතු ය. ඒ අපට ජාතියක් ලෙස නිදහස් වීමට ය. ඊනියා සංචාරක කර්මාන්තය (මෙය කර්මාන්තයක් වන්නේ කෙසේ ද?) ඇත්තේ මුදල් ඉපයීමට ය. බටහිර ආර්ථිකයට කුමක් හෝ කවුරුන් හෝ විකුණා මුදල් ඉපයීමේ වරදක් නැති විය හැකි ය. එහෙත් අපේ ආර්ථිකයක අරමුණු විය යුත්තේ කවරක් ද? මීළඟ පාර්ලිමේන්තුවට මේ පිළිබඳව ද සොයා බලා සුදුසු පියවර ගැනීමට බල කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva